# කෘෂි අලෙවි තොරතුරු

එල්.පී. රූපසේන
අංශ ප්‍රධාන අලෙවි හා ආහාර ප්‍රතිපත්ති

## සහල්

දෙසැම්බර් මාසයේ සහල් මිළ ගණන් ඉහළම මට්ටමට පත්වූ අතර, ඉන්පසු ක්‍රමයෙන් අඩු වී ගෙන යන බවක් පෙන්නුම් කරයි. පසුගිය ජනවාරි මාසයේ සහල් මිළ ගණන් වල අඩුවීමත් සුළු වශයෙන් වාර්තා වී ඇත. උදඃ ලෙස පළමුවන ශ්‍රේණියේ සම්බා කිලෝ 65ක තොග මිළ ජනවාරි මාසයේ මුල් සතියේ රු. 1575 ක්වූ අතර, මාසය අවසානවන විට රු. 1456 දක්වා අඩු වී ඇත. ජනවාරි මාසයේ වාර්තා කළ සාමාන්‍ය මිළ ගණන් කිලෝ 65 ක් සඳහා රු. 990 (නාඩු 11 ශ්‍රේණිය) සිට රු. 1510 (සම්බා 1 ශේණිය) අතර පැවතුනි. කිලෝවක සිල්ලර මිළ රු. 17.00-25.50 අතර පැවතුනි.

මෙම අවුරුද්දේ විශේෂ ලක්‍ෂණයක් නම් පසුගිය අවුරුද්දේ ජනවාරි මාසය හා සසඳන විට සම්බා හැර අනිකුත් සහල් වර්ගයන්හි මිළ වැඩිවීම එතරම් විශාල නොවීමයි. සම්බා තොග මිළ 20% කින්ද, සිල්ලර මිළ 10% කින් ද පසුගිය වසරට සාපේක්‍ෂව වැඩිවී ඇත. නමුත් රතු කැකුළු හැර අනිකුත් සියළුම සහල් වර්ගයන්හි මිළෙහි වැඩිවීම 5% කටත් වඩා අඩු ය. මෙයට ප්‍රධාන හේතුව වූයේ තත්තවයෙන් ඉහළ ආනයනික සහල් තොග, වෙළඳ පොලේ සුලභව තිබීමයි.

සම්බා වී කිලෝවක තොග මිළ රු. 11 දක්වා වැඩි වූ අතර, නාඩු වී කිලෝවක තොග මිළ රු. 9.25 දක්වා ජනවාරි මාසය වනවිට ඉහළ නැගුණි. නමුත් ජනවාරි මාසය අවසන් වන විට වී මිළෙහි පහල බැසීමක් දක්නට ඇත. ජනවාරි මැද භාගයේ සිට මහ කන්නයේ වී අස්වැන්න නෙළීම ආරම්භ වන නිසා වී මිළ ක්‍රමයෙන් අඩුවීමට පටන් ගෙන ඇත. පෙබරවාරි මාසයේ මුල් සතිය වනවිට සම්බා වී කිලෝවක මිළ රු. 9 දක්වා ද, නාඩු කිලෝවක මිළ රු. 7 දක්වා ද පහළ වැටී තිබුණි. සාමාන්‍යයෙන් වී මිළ අඩුම මට්ටමට පත් වන්නේ මාර්තු මාසයේ ය.

## අතිරේක භෝග :

ජනවාරි මාසයේ පැවති අධික ලොකු ළූණු මිළ වාර්තාගත සිද්ධියකි. කිලෝවක සිල්ලර මිළ රු. 80 ඉක්මවිය. නමුත් ජනවාරි මාසය අවසන්වන විට මිළ සීඝ්‍ර වශයෙන් අඩුවිය. සතොස මගින් ආනයනික ලොකු ළූණු බෙදා හැරීම මෙයට හේතුව යි. අධික ලොකු ළූණු මිළ රතුළූණු ගොවියාට විශාල වාසියක් විය. රතුළූණු කිලෝවක් සඳහා ගොවිපොල මට්ටමේ පැවති මිළ රු. 40 ඉක්මවී ය. අනෙක් අතට, ඉහළ ලොකු ළූණු මිල මීළඟ වරයේ ගොවීන් ගබඩා කිරීමට පෙළඹවීමට රුකුලක් වනු ඇත.

මෙවර මුං ඇට මිළ වෙනද මෙන් අඩු වූයේ නැත නිෂ්පාදන මිළ කිලෝවක් සඳහා රු. 20 ඉක්ම වූ අතර සිල්ලර මිළ රු. 30 ට වඩා වැඩි මට්ටමක පැවතුණි. නිෂ්පාදන ප්‍රමාණය අඩුවීම, ඉහළ යාමට හේතුව යි. මුං ඇට මිළ ඉදිරියට වැඩි විය හැකි නිසා

### 1993 ජනවාරි මස කොළඹ පැවති සහල් තොග සහ සිල්ලර මිළ ගණන්

| වර්ගය | පළමු සතිය | දෙවන සතිය | තුන්වන සතිය | හතරවන සතිය | මාසයේ සාමාන්‍ය මිළ | 1992 ජනවාරි වලට සාපේක්‍ෂව මිළෙහි වෙනස% |
|---|---|---|---|---|---|---|
| **තොග (කිලෝ 65 ක් සඳහා)** | | | | | | |
| සම්බා I | 1575.00 | 1519.00 | 1489.00 | 1456.00 | 1510.00 | 20.32 |
| සම්බා II | 1496.00 | 1403.00 | 1388.00 | 1328.00 | 1404.00 | 21.77 |
| සම්බා III | 1400.00 | 1295.00 | 1239.00 | 1231.00 | 1291.00 | 24.98 |
| කෝරා I | 1100.00 | 1093.00 | 1091.00 | 1061.00 | 1086.00 | -1.63 |
| කෝරා II | 1057.00 | 1033.00 | 1024.00 | 998.00 | 1028.00 | 0.98 |
| නාඩු I | 1118.00 | 1089.00 | 1046.00 | 997.00 | 1063.00 | -1.39 |
| නාඩු II | 1056.00 | 1010.00 | 975.00 | 918.00 | 990.00 | -0.40 |
| රතු කැකුළු | 1251.00 | 1216.00 | 1221.00 | 1203.00 | 1223.00 | 6.26 |
| සුදු කැකුළු | 1005.00 | 1025.00 | 1040.00 | 1016.00 | 1022.00 | -0.49 |
| **සිල්ලර (කිලෝ 1 ක් සඳහා)** | | | | | | |
| සම්බා I | 25.98 | 25.52 | 25.28 | 24.96 | 25.44 | 11.14 |
| සම්බා II | 24.26 | 23.62 | 23.44 | 23.32 | 23.66 | 10.01 |
| සම්බා III | 22.29 | 21.66 | 2173 | 21.42 | 21.78 | 10.00 |
| කෝරා I | 18.61 | 18.25 | 18.23 | 18.16 | 18.34 | 0.77 |
| කෝරා II | 17.53 | 17.23 | 17.52 | 17.18 | 17.37 | 2.78 |
| නාඩු I | 18.80 | 18.01 | 18.34 | 18.01 | 18.29 | 1.61 |
| නාඩු II | 17.31 | 16.98 | 17.30 | 16.66 | 17.07 | 2.10 |
| රතු කැකුළු | 21.64 | 21.55 | 21.26 | 20.89 | 21.34 | 7.61 |
| සුදු කැකුළු | 17.84 | 17.37 | 17.11 | 17.37 | 17.43 | 2.95 |

ගබඩා කර තබා ගැනීමෙන් වැඩි මිළක් ලබා ගත හැක.

මිරිස් කිලෝවක තොග මිළ රු. 128 දක්වා ද, සිල්ලර මිළ රු. 160 දක්වා ද වැඩිවිය. නිෂ්පාදන මිළ රු. 110 ක් දක්වා වැඩි විය. මිරිස් මිළ ඉහළ යාමට හේතුව ආනයනික මිරිස් වලට වෙළඳ පොලේ ඉල්ලීමක් නොතිබීමයි. දේශීය මිරිස් මෙන් දෙගුණයක් ආනයනික මිරිස් පාවිච්චිය සඳහා අවශ්‍ය බව පාරිභෝගිකයෝ පවසති. පාරිභෝගික රුචියට සරිලන අන්දම ට භාන්ඩ සැපයීමෙන් හොඳ මිළක් ලැබෙන බවට මිරිස් කදිම නිදසුනකි.

## එළවළු

හේන් එළවළු වෙළඳ පොළට පැමිණීමත් සමග ජනවාරි මාසයේ දෙවන සතියේ සිට එළවළු බොහොමයක මිළ ගණන් සැළකිය යුතු ලෙස අඩු වී ඇත. නමුත් ලීක්ස් සහ බීට්රූට් මිළ ගණන් වල සැළකිය යුතු වැඩිවීමක් වාර්තා වී ඇත. එනම් ලීක්ස් කිලෝවක තොග මිළ රු. 21.90 ක් ද බීට් රූට් කිලෝවක තොග මිළ රු. 19.77 ක් ද ජනවාරි මස සඳහා වාර්තා වී ඇත. මේ අනුව ලීක්ස් කිලෝවක සිල්ලර මිළ රු. 34.50 ක්ද, බීට් රූට් කිලෝවක සිල්ලර මිළ රු. 32.93 ක් ද වී ඇත. පසුගිය වසරට සාපේක්ෂව ලීක්ස් කිලෝවක තොග මිළ 50% කින් ද, බීට් රූට් මිළ 25% කින් ද ඉහළ ගොස් ඇත. වට්ටක්කා, මිළ අඩුම එළවළු වර්ගය වූ අතර, සාමාන්‍යයෙන් කිලෝවක මිළ රු. 11.80 කි.

ජනවාරි මාසයේ මිළ අධිකම එළවළු වර්ගය වූයේ මාළු මිරිස් ය. එහි කිලෝවක තොග මිළ රු. 22.77 ක් පමණ වූ අතර සිල්ලර මිළ රු. 36.66 ක් විය. බෝංචි කිලෝව ක සිල්ලර මිළ රු. 23 ක් පමණ වූ අතර පසුගිය වසර හා සසඳන විට වර්තමාන මිළ 10% කින් පහළ බැස ඇත.

## මාළු

මාළු මිළ ගණන් සැළකිය යුතු ලෙස ජනවාරි මාසය තුළ උච්චාවචනය වී ඇත. මිළ අඩුම මාළු වර්ගය වන සාලයා කිලෝවක තොග මිළ රු. 36.53 ක් වූ අතර, සිල්ලර මිළ රු.45.70 කි. මිළ වැඩිම මාළු වර්ගය වූ තෝරා කිලෝව ක තොග මිළ රු. 139.19 ක් වූ අතර, සිල්ලර මිළ රු. 183.86 ක් වී ඇත. පසුගිය වසරේ ජනවාරි මාසය හා සසඳන විට මාළු වර්ග බොහොමයක මිළ ගණන් පහළ මට්ටමක පවතී.

## බිත්තර:

ජනවාරි මාසයේ දුඹුරු බිත්තරයක තොග මිළ රු. 2.16 ක් වූ අතර. සිල්ලර මිළ රු. 2.40 කි. සුදු බිත්තරයක තොග මිළ රු. 2.08 ක්වූ අතර සිල්ලර මිළ රු. 2.99 කි. 1992 ජනවාරි මස පැවති මිළ ගණන් හා සසඳන විට 1993 ජනවාරි මස බිත්තර මිළ 6% කින් පමණ අඩු වී ඇත.